# කලාප අධ්‍යාපන කාර්යාලය - පස්සර
# Zonal Education Office - Passara

## ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මෙහෙයවීමෙන් සිදු කරන පෙරහුරු පරීක්ෂණ මාලාව අංක 03

## I-පත්‍රය

සකස් කළේ : ඩී.එම්.ජී.ගුණසේකර
බ/ඉසිපතන කනිෂ්ඨ විද්‍යාලය

පරීක්ෂා කළේ : ධනුෂ්කා රත්නමාලී
බ/ඉසිපතන කනිෂ්ඨ විද්‍යාලය

**විභාග අංකය :**

**කාලය පැය 01**

විභාගෙට පෙනී සිටින ඔබට උපදෙස් :


* ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉරි මත ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* පිළිතුරු තුනක් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
* පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුර තිත්ඉර මත ලියන්න.
* කටුවැඩ කිරීම සඳහා කඩදාසි සපයනු ලැබේ.

## උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| **එකතුව** | |
| **අවසාන ලකුණ** | |
| **ඉලක්කමෙන්** | |
| **අකුරෙන්** | |

| | කෙටි අත්සන හා සංකේතඅංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර,ප්‍රදානය කළ ලකුණ සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධානපරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදි ය. | V/I/S/CH |

1පහත දැක්වෙන පින්තූරය දෙස බලා එහි අදහස නිවැරදිව දක්වා ඇති ප්‍රකාශය තෝරන්න.




**(1) ළමයෙක් ඔන්චිල්ලා පදිමින් සිටියි.**

**(2) පිරිමි ළමයි දෙදෙනෙකු රණ්ඩු කරයි.**

**(3) ළමයි සිව් දෙනෙකු සෙල්ලම් පිට්ටනියක සිටිති.**

**2.** පහත දැක්වෙන පින්තූරයේ ඇති ද්‍රව්‍ය ප්‍රමාණය හා හැඩය අනුව කොටස් කීයකට වෙන් කළ හැකි ද?





**(1) 3යි**

**(2) 4යි**

**(3) 5යි**


**3.** පහත දැක්වෙන රටාව බලා ඊළඟට එන රටාව තෝරන්න.






(1) (2) (3)

**4.** මුල් රූපයට සමාන රූපය තෝරන්න.






(1) (2) (3)

**5.** නිල්, කහ, රතු, සුදු පාට හතරකින් සමචතුරස්‍ර **4**ක් තිබේ. එම හතරම යොදාගෙන විශාල සමචතුරස්‍රයක් සෑදීමට සදෙව් සූදානම් වේ. ඔහුට කුඩා සමචතුරස්‍ර මාරුකරමින් එකිනෙකට වෙනස් සමචතුරස්‍ර කීයක් සෑදිය හැකි ද?

**(1) 16** **(2) 24** **(3) 32**

**6.** පහතදී ඇති සංඛ්‍යා රටාව තේරුම් ගෙන හිස්තැනට ආයුතු අගය තෝරන්න.




**(1) 52** **(2) 67** **(3) 93**

**7.** සනකයක මුහුණත් හය මත**1,2,3,4,5,6** යන ඉලක්කම් ලියා ඇත්තේ එක් එක් මුහුණත මත එක් ඉලක්කම බැගින් වන පරිදි සහ එකිනෙක ප්‍රතිවිරුද්ධ මුහුණත් මත ඇති ඉලක්කම් වල එකතුව **7** වන පරිදිය. එහි එක් ශීර්ෂයකට අයත් මුහුණත් තුනෙහි ඇති ඉලක්කම්වල එකතුවට තැබිය හැකි වැඩිම අගය වන්නේ

**(1) 18** **(2) 12** **(3) 15**

**8.** වෙනුති සඳුදාට වඩා මුද්දර **7**ක් වැඩියෙන් අඟහරුවාදා ද, අඟහරුවාදාට වඩා මුද්දර **2**ක් අඩුවෙන් බදාදා ද එකතු කරන ලදී. ඇය එකතු කළ මුළු මුද්දර සංඛ්‍යාව **87**ක් නම් සඳුදා එකතු කළ මුද්දර ප්‍රමාණය කොපමණද?

**(1) 25** **(2) 28** **(3) 29**


**9.** විනිවිද නොපෙනෙන බෑගයකට රතු, නිල්, කොළ වර්ණ වලින් එකකින් **6** බැගින් එකම ප්‍රමාණයේ බෝල දමා ඇත. බෑගය දෙස නොබලා නිල් පාට බෝල **6** ම එළියට ගැනීමට සමන්ට අවශ්‍ය විය. එක් වරකට එක් බෝලයක් පමණක් ගැනීමට හැකි නිසා ඔහුට එම බෝල **6**ම ලබා ගැනීමට කී වරක් උත්සහ ගත යුතුද?

**(1) 13** **(2) 15** **(3) 18**

**10.** සනුලිගේ නිවසේ සිට පාසලට ඇති දුර කිලෝමීටර් **2**කි. ඇය මුළු දුරෙන් හරි අඩක් පාසල වෙත පැමිණෙමින් සිටිය දී කෑම පෙට්ටිය මේසය මත තබා පැමිණි බව සිහි විය. ඇය නැවතත් ගෙදරට ගොස් කෑම පෙට්ටිය රැගෙන පාසල් පැමිණ සවස නිවසට ගියාය. එදින ඇය ගමන් කළ දුරු මුළු දුර කොපමණද?

**(1) කිලෝමීටර් 4** **(2) කිලෝමීටර් 2** **(3) කිලෝමීටර් 6**

**11.** පහත රූපයේ පෙන්වා ඇති පරිදි සණක රාමුවකට නිල්, සුදු, රතු යන වර්ණ වලින් බෝල දෙක බැගින් දමා ඇත. එක් කුරකට උපරිම වශයෙන් දැමිය හැක්කේ **3**ක් පමණි. එම කුරුවලට පමණක් බෝල මාරු කරමින් එකම වර්ණ වල බෝල එකම කුරකට ලැබෙන සේ මාරු කිරීමට අවම වශයෙන් කී වතාවක් බෝල මාරු කළ යුතුද?




**(1) 5** **(2) 6**
**(3) 7**


**12.** දිනුලි, තිනුලි, රණුමි ළඟ පිළිවෙලින් රුපියල් 9ක්, රුපියල් 17ක්, රුපියල් 7ක් තිබේ. ඔවුන් තිදෙනාම එම මුදල් එකතු කර ආපනශාලාවකට ගොස් රුපියල් 10 කාසියකට චොකලට් එක බැගින් ද 5 කාසියකට ටොපි 1 බැගින් ද රුපියල් 2 කාසියකට සීනිබෝල 1බැගින්ද  මිලට ගත්හ. ඔවුන් ළඟ තිබූ සියලූම මුදල් වලට චොක්ලට් , ටොපි, සීනි බෝල ගත්තේ නම් ඒවා ගත් ප්‍රමාණයන් පිළිවෙලින්

(1) 1 ,3 ,4 (2) 2,1,4 (3) 1, 4, 3

**13.** ලීටර් 70ක් අල්ලන ජල බඳුනක් තිබේ. නිමල් ලීටර් 4ක බඳුනකින් ජලය ගෙනැවිත් එයට පුරවයි. ජලය ගෙනෙන සෑම වාරයක දී ම මිලි ලීටර් 500ක් හැලෙයි. බඳුනෙන් භාගයක් ජලය පිරවීමට කී වරක් ජලය ගෙන ආ යුතු ද?

(1) 20 (2) 15 (3) 10

**14.** මෙමබඳුනේ  උස කොපමණ ද?




(1) 16cm


(2) 15 cm

(3) 20 cm

**15.** ධාවන තරගයකට තරගකරුවන් තිදෙනෙක් ඉදිරිපත් වූහ. පළමු හා දෙවන ස්ථාන ලබා ගත් දෙදෙනාට තරගය නිමා කිරීමට ගත වූ කාලයේ එකතුව තත්පර 43කි. තෙවැනි ස්ථානය ලබා ගත් ක්‍රීඩකයාට තරගය නිමා කිරීමට ගත වූ කාලය තත්පර 23 කි. පළමු ක්‍රීඩකයාට ගත වූ කාලය කොපමණ විය හැකිද?

(1) තත්පර 23 (2) මිනිත්තු 22යි (3) මිනිත්තු 21යි

**16.** විශාල කඩදාසියෙන් කුඩා හැඩතල කීයක් කපා ගත හැකි ද?





(1) 6
(2) 9
(3) 10

**17.** තිමාලි ඡායාරූපයක් පෙන්වා මෙසේ කීවාය. “මෙම ඡායාරූපයේ සිටින කාන්තාව මගේ අම්මාගේ අම්මාට ද අම්මා කියා ආමන්ත්‍රණය කරන බව ඇසී ඇත,” යනුවෙනි. මෙම ඡායාරූපයේ සිටින්නේ තිමාලිගේ

(1) නැන්දා (2) පුංචි (3) ආච්චි

**18.** පළලමෙන් දෙගුණයක් දිග වූ සෘජුකෝණාස්‍ර කිහිපයක් පහත ආකාරයට තබා ඇත. එහි වටේ දිග විය හැකකේ



(1) 42
(2) 24
(3) 36

**19.** ශාන්ගේ මල්ලී ශාන්ට වඩා අවුරුදු 3කින් බාල වන අතර ශාන්ගේ අයියා ශාන්ට වඩා අවුරුදු 2කින් වැඩි මහලු ය. තිදෙනාගේම වයස්වල එකතුව අවුරුදු 44ක් නම් ශාන්ගේ මල්ලීගේ වයස කීය ද?

(1) 12 (2) 15 (3) 17

**20.** ඒකාකාරී වේගයකින් ගමන් කරන ත්‍රිරෝද රථ තුනක් නගර කිහිපයක් පසු කළ ආකාරය පහත දැක්වේ.
නිල්, රතු, කළු ත්‍රිරෝද රථ පිළිවලින් **A,B,C** නගර වලින් ගමන් ආරම්භ කරයි.

නිල් ත්‍රීරෝද රථය කහ තීරෝද රථයට පෙර **B** නගරය පසු කළේය.
රතු ත්‍රීරෝද රථය නිල් ත්‍රීරෝද රථයට මිනිත්තු 10 කට පසු **C** නගරය පසු කළේය
කලු ත්‍රීරෝද රථය නිල් ත්‍රීරෝද රථයට මිනිත්තු 6කට පසු **D** නගරය පසුකළේය.

වැඩි ම දුරක් ඇත්තේ කුමන නගර දෙක අතර ද?

(1) A-B (2) B-C (3) C-D

**21.** පුරුක් 15ක් ඇති දම්වැලක් කොටස් 1,2,3,4,5ක් ලෙස වෙන් කර දෙන ලෙස පෑස්සුම් ශිල්පියෙකුට පවසන ලදි.ඒසඳහා ඔහු අවම දම්වැල් පුරුක් කීයක් ගලවා නැවත පෑස්සිය යුතු ද?




(1) 3 (2) 4 (3) 5

**22.** බසයක මගීන් පිරිසක් සිටි අතර පළමු නැවතුමේ දී මගීන් 18ක් බැස ගිය අතර ඊ ළඟ නැවතුමේ දී තවත් 13 දෙනෙකු මෙම බසයට ගොඩ විය. දැන් මෙම බසයේ මගීන් 44 සිටී නම් පළමු නැවතුමට ඒමට පෙර බසයේ කී දෙනෙක් සිටී ද?

(1) 31 (2) 57 (3) 49

**23.** මෙහි දැක්වෙන මුළු ත්‍රිකෝණ ගණන කීය ද?



(1) 12
(2) 14
(3) 15


**24.** කණ්ඩායමකට ළමයින් තුන්දෙනෙක් වන සේ කණ්ඩායම් තුනකට බෙදා පාට තුනකින් බෝල ලබා දී ඇත.

| | පළමු කණ්ඩායම | දෙවන කණ්ඩායම | තෙවන කණ්ඩායම |
|---|---|---|---|
| නිල් ⟶ | 1 චතුර | 1 නෙත්මි | 1 සහන් |
| කහ ⟶ | 2 අශාන් | 2 තරුක | 2 උදාර |
| රතු ⟶ | 3 නදුන් | 3 වරුණි | 3 නයන |

පළමුව තම කණ්ඩායමේ නිල්පාට බෝල ඇති ළමයින් රතු පාට බෝල ඇති ළමයින් සමඟ බෝල හුවමාරු කර ගත් අතර, දෙවනුව පළමු කණ්ඩායම හා තෙවන කණ්ඩායම් තම අංකය හිමි ළමයා සමඟ බෝල හුවමාරු කළහ. දැන් මුලින් තිබූ පාට වෙනස් නොවුණු ළමයින් ගණන කීය ද?

**(1)** 1 **(2)** 2 **(3)** 3

**25.** එකම ප්‍රමාණයේ පෙට්ටි 9ක් ගෙන ඒවාට කිලෝ එක බැගින් බර ඇති ගස්ලබු ගෙඩිය බැගින් දමා පාර්සල් කර තිබේ. යම් වැරදීමකින් එක් පෙට්ටියකට කිලෝ එකට අඩු ගස්ලබු ගෙඩිය දමා පාර්සල් කර තිබේ. එය සොයා ගැනීමට වරකට පෙට්ටි දෙක බැගින් තැටි තරාදියකට දමා බලයි. බර අඩු පෙට්ටිය සොයා ගැනීමට තරාදිය අඩු ම කීවරක් භාවිත කළ යුතු ද?



**(1)** 8වරක් **(2)** 4 වරක් **(3)** 5 වරක්


**26.** පඩිපෙළක පඩි 12ක් ඇත. **A,B,C,D** යන සිව් දෙනා පිළිවෙළින් 3,4,5,6 යන පඩිවල සිට එකම වේගයෙන් ඉහළට නැග පහළට බසියි. එකම වේලාවක මුලින්ම එකම පඩියක් මතට පැමිණෙන්නේ කවුරුන්ද?

**(1)** D-C **(2)** C-A **(3)** A -D

**27.** මගේ අත් ඔරලෝසුවේ පෙරවරු 8. 00 නිවැරදි වේලාව තබන ලදි. පැය 6 කට පසුව බලන විට පස්වරු 1.30 ලෙස දැක්වේ. ඔරලෝසුවේ ඇති දෝෂය කුමක් ද?

(1) පැයකට මිනිත්තු 5ක් වැඩියෙන් ගමන් කරයි.
(2) පැයකට මිනිත්තු 5ක් අඩුවෙන් ගමන් කරයි.
(3) පැයකට මිනිත්තු 20ක් වැඩියෙන් ගමන් කරයි

**28.** හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව සොයන්න.




(1) 14
(2) 16
(3) 19

**29.** රහස් භාෂාවෙන් ලියා ඇති සංඛ්‍යා 3ක් පහත දැක්වේ. ඒවා ලියා ඇත්තේ අපිළිවෙළටය.

| | |
|---|---|
| **TACBD –** | **78596** |
| **ABSPE –** | **45621** |
| **PEAWC –** | **52378** |


**TACBD** ගැළපෙන සංඛ්‍යාව වන්නේ

(1) 52378 (2) 45621 (3) 78596

**30.** නොගැලපෙන වචනයක් අඩංගු පිළිතුර තෝරන්න

(1) වට්ටක්කා, කොමඩු, වැල්දොඩම් , පිපිඤ්ඤා, මිදී.
(2) අඹ, දිවුල්, පේර, බෙලි, ඇපල්,
(3) අන්නාසි, රම්පේ, සේර, එනසල්, කරාබු නැටි

**31.** ළමයෙක් මිදුලේ අඳින ලද මාර්ගයක් පහත දැක්වේ. **A** සිට ගමන් අරඹන ළමයෙක් **B** දක්වා යන විට වමට කීවරක් හැරීමට සිදුවේ ද?






(1) වාර 6 (2) වාර 7 (3) වාර 13


**32.** 18 දෙනෙකු සිටින පන්තියක ළමයින් 6දෙනෙකු දැනුම මිනුම තරගයට තෝරා ගැනීම සඳහා අවශ්‍ය විය. ඒ සඳහා තරග වට 3ක් පැවැත්වෙන අතර එක් වටයකින් වැඩිම ළකුණු ගන්නා ළමයින් දෙදෙනෙක් තෝරා ගනී.වට තුනට ම මුහුණ දෙන ළමයින් ගණන කීය ද?


(1) 18 (2) 16 (3) 14

**33.** මෙම රූප දෙක එක් කර ගත් විට ලැබෙන රූපය වන්නේ



(1) 

(2) 

(3) 

**34.** ජලය ලීටර 20ක් අල්ලන බඳුනක් පිරවීමට අයියා ලීටර 5ක් අල්ලන බඳුනකින් ජලය දමයි. ජලය දැමූ හැම වාරයකටම පසු මල්ලී ලීටර 2ක් ආපසු ගනියි. ටැංකිය සම්පූර්ණයෙන් පිරවීමට අයියා ජලය දැමිය යුතු අවම වාර ගණන කීයද?

(1) 4 (2) 6 (3) 8

**35.** පහත දී ඇති වාක්‍යවලින් නිවැරදි අදහසක් ලබා දෙන වාක්‍ය තෝරන්න.

(1) සන්නාලියා ඉතා ලස්සනට සපත්තුවක් සාදා නිම කළේ ය.
(2) කරණවැමියා රැවුල හා කොණ්ඩය කපා මුදල් ලබා ගත්තේ ය.
(3) අරක්කැමියා ඉතා ලස්සන පිළිමයක් නෙළුවේ ය.

**36.** නැකැත් බලන්නට රැගෙනයි යන්නේ
වැඩිහිටියන් නමදින්නට යන්නේ
හෙප්පුව ඇතුලේ නිතර සිටින්නේ
කවුදැයි කවුදැයි මා පවසන්නේ මෙම කවියෙන් කියවෙන්නේ

(1) ඔරලෝසුව (2) බුලත් (3) ගිරය


**37.** පන්තියක සිටින ළමයින් තිදෙනෙකුගේ බරෙහි එකතුව 115kg වේ. එයට ප්‍රසිත්ගේ බර එකතු කර 4න් බෙදූ විට 40kg විය. ප්‍රසිත්ගේ බර වන්නේ,

(1) 160 kg (2) 45 kg (3) 75 kg

**38.** මාගේ අත් ඔරලෝසුවේ නිතර ම පැය 1ක් වැඩියෙන් වේලාව පෙන්නුම් කරයි.එම වේලාවෙන් පෙ.ව. 8.30 නගරයට යාමට පිටත් වූ මම නගරයට යන විට මිතුරාගේ අත් ඔරලෝසුවේ නිවැරදි වේලාව ප.ව. 12.15 ලෙස දුටුවේ ය.මට නගරයට යාමට ගත වූ වේලාව කොපමණ ද?

(1) පැය 3 මිනිත්තු 45 (2) පැය 4 මිනිත්තු 45 (3) පැය 5 මිනිත්තු 45

**39.**




නිසල් හා උදේශ් යම්කිසි ක්‍රීඩාවක් කිරීමට යොදා ගත් පුවරුවක් පහත දැක්වේ.නිසල් රතු කැටයක් ද උදේශ් නිල් කැටයක් **A** මත සිට ආරම්භ කර නිසල් කොටු තුනෙන් තුනටත් උදේශ් කොටු පහෙන් පහටත් එක් පැත්තකට ගෙන යයි. ගෙනයාම ආරම්භකර නැවත දෙදෙනාම හමුවන්නේ කුමන කොටුවේ දී ද?

(1) D (2) C (3) L

**40.** මීටර 2ක් උස මීටර 4ක් දිග බිත්තියක තීන්ත ගෑමට තීන්ත ලීටර 2ක් අවශ්‍ය වේ. මීටර 4ක් උස මීටර 4ක් දිග බිත්තියක තීන්ත ගෑමට තීන්ත ලීටරකොපමණ ප්‍රමාණයක් අවශ්‍ය වේද?

(1) ලීටර 4 (2) ලීටර 3 (3) ලීටර 6

කලාප අධ්‍යාපන කාර්යාලය - පස්සර
# Zonal Education Office - Passara

## ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මෙහෙයවීමෙන් සිදු කරන පෙරහුරු පරීක්ෂණ මාලාව අංක 03

### II-පත්‍රය

සකස් කළේ : ඩී.එම්.ජී.ගුණසේකර
බ/ඉසිපතන කනිෂ්ඨ විද්‍යාලය

පරීක්ෂා කළේ : ධනුෂ්කා රත්නමාලී
බ/ඉසිපතන කනිෂ්ඨ විද්‍යාලය

විභාගඅංකය..................................

කාලය පැය 1යි මිනිත්තු 15

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්.**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව **තුළඇති තිත් ඉර** මත ලියන්න.
- තුන්වෙනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද **ඔබේ විභාග අංකය** ලියන්න
- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සපයන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න60ක් ඇත. සමහර ප්‍රශ්නවල අනු කොටස් ද ඇත.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවල තිත් ඉරි මත පිළිතුර ලියන්න.
- කටු වැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේතඅංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර,ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධානපරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදි ය. | V/I/S/CH |

01.දැක්වෙන ඡේදය කියවා ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

පාසලටත් අපේ ගෙදරටත් අතර එක් තැනක පාළු අම්බලමක් වෙයි. ළමයි තාප්පයකින් වටවුණු ඒ ඉඩමේ පොල් ගස් හතරේ හටගන්නා කුරුම්බා කඩා ගෙන කති. අම්බලම වත්තේ කුරුම්බා කඩාගෙන කන ළමයින්ගේ නායකයා ජින්නාය. ඊළඟ නායකයා මම ය. ජිනපාල ගසට නැග කුරුම්බා කඩා බිම දමන විට ඒ කුරුම්බා අහුලා ගෙනැවිත් ළමයින්ට බෙදා දෙන්නේ මා විසිනි. පාසලෙහි සිට ගෙදර ආ විගස පොත් හා ගල් ලෑලිත් මේසයක් උඩ හෝ ඇඳක් උඩ දමා හෝ මා දුවන්නේ තවත් ළමයින් තුන් හතර දෙනකු සමග කෙළිසෙල්ලම් කරනු පිණිස ය. ජිනපාල ද මා සමග එයි. ඔහු මා පාසලෙන් එනතෙක් මග බලා සිටින්නේ ද මා සමග සෙල්ලමට දුවනු පිණිස ය.

( මාර්ටින් වික්‍රමසිංහ)

I. පාසලටත් අපේ ගෙදරටත් අතර එක් තැනක තිබුණේ කුමක් ද?

..............................................................................................................

II. තාප්පයකින් වට වුණු ඒ ඉඩමට ගොස් ළමයින් කරන්නේ කුමක් ද?

..............................................................................................................

III. අම්බලම වත්තේ කුරුම්බා කඩා ගෙන කන ළමයින්ගේ නායකයා කවු ද?

..............................................................................................................

IV. ඡේදයේ සඳහන් උත්තම පුරුෂ ඒක වචන අනුක්ත පදයක් ලියන්න.

..............................................................................................................

V. පාපිලි දෙකක් එක ළඟ යෙදුණු වචනයක් ඡේදයේ සඳහන් වේ. එය කුමක් ද?

..............................................................................................................

VI. මෙම ඡේදය උපුටා ගත් පොතෙහි රචකයා කවුද?

................................................................................................. ( ලකුණු 6 )

02. පහත සඳහන් එක් එක් වගන්තියට ගැළපෙන නිවැරදි ආඛ්‍යාත පදය වරහන් තුළින් තෝරා ගන්න යටින් ඉරක් අඳින්න.

i. ගොවියෝ උදෑසන ම කුඹුරට ගොස් ගොයම් .................... ( කැපුවේය /කැපුවෝය )

ii. අයියාත් නංගීත් මමත් පාසලට පිටත්....................... (වුණෙමු / වූහ)

iii. ඇය උදෑසනම සේවයට ................. ( ආවේ ය /ආවා ය )

iv. ඊයේ දින හැමු තද සුළඟින් ගස් බිමට කඩා ..................... ( වැටුණෝය/ වැටුණේය )

v. අක්කා සමඟ අයියා මල් කඩා පෝච්චියට .......................... (දැම්මේය /දැම්මාය)

( ලකුණු 5 )

03. පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා ලියන්න.

i. ඇතා ගස්වල අතු කඩා දමමින් කැලෑව තුළට යයි.

..............................................................................................................

ii. ගුරුතුමිය ලස්සන ගීතයක් ළමයින්ට කියා දෙයි.

..............................................................................................................

( ලකුණු 2 )

04. පහත සඳහන් වචනවලින් එක් වචනයක අක්ෂර වින්‍යාසය වැරදිය. එම වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

i. පරිගණකය , ගැහැණිය, නෙලුම් මල, ජෝෂ්ඨ

ii. උදවු , කොටඨාසය, මලාණික , විශිෂ්ට

( ලකුණු 2 )

05. පහත සඳහන් යෙදුම්වල අර්ථය ලියන්න.

I. අබමල් රේණුවක් ........................................................................................................

II. මහදැන මුත්තගෙ නුවණ වගේ ......................................................................................

06. පහත වචන නිවැරදිව ගලපා වගන්ති නැවත ලියන්න ( ලකුණු 2 )

i. රිප්ප/ කිවුවා/ වැඩියි /සුමිත්/ මල්ලි /කියලා/ තියෙන /දිග

........................................................................................................................

ii. නිර්මාණ/ දිනය/ ගන්නා/ භාර/ කවදා ද? / අවසන්

........................................................................................................................

07. පහත වගන්තිවල ඉරි ඇදි පදයට විරුද්ධ පදය යොදා අදහස නිවැරදි වන සේ නැවත ලියන්න.

I. ගුරුවරු <u>කීකරු</u> ළමයින්ට ප්‍රශංසා කරති.

........................................................................................................................

II. නිෂායා නිවසේ තිබූ <u>පිරිසිදු</u> ඇඳුම් අල්මාරියට දැම්මා ය.

........................................................................................................................

08. නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉරි මත ලියන්න. ( ලකුණු 4 )

i. උත්තම පුරුෂ බහු වචන අතීත කාල ක්‍රියා පදයකි. ( කෑවෝ ය / ගියෙමි / ආවෙමු )

..............................................................................

Ii . ප්‍රථම පුරුෂ ඒක වචන වර්තමාන කාල පදයකි ( රඟ පායි / රඟ පෑවෙමි / රඟ පාති )

.............................................................................. ( ලකුණු 2 )

09. පහත දැක්වෙන වගන්තියේ අදාළ ස්ථානවල විරාම ලකුණු යොදන්න.

අර තනි කකුලේ මේසයක් කව්ෂා කීවා ය

( ලකුණු 1 )

10. පහත එක් එක් රූපවලට ගැළපෙන ඉංග්‍රීසි වචනය ලියන්න





| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |

( ලකුණු 2 )

11. පහත දීඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

i you/please/Could/duster?/bring/the

..............................................................................................

Ii. will/sweep/I/the/classroom

( ලකුණු 2 )

..............................................................................................

12.එක් එක් ඉංග්‍රීසි වචනයේ අර්ථය සිංහලෙන් ලියන්න

(i) Mammoty ..................................... (ii) Mosquito ..................................

( ලකුණු 2 )

13. “සෙව්වායි” යන දෙමළ වචනයේ අදහස සිංහලෙන් ලියන්න.


..................................................................

14.පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.

මට මල්ලි කෙනෙක් ඉන්නවා ..................................................................................

( ලකුණු 2 )

15.පහත ගණක රාමුවේ ඇති සංඛ්‍යාවට එකක් අඩු සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න





..............................

16.35256, 35156, 35196 යන සංඛ්‍යා අවරෝහණ පිළිවෙලට නැවත ලියන්න.

..........................................................................................................................................

17.රූපයේ දැක්වෙන පාට කළ කොටස හතරෙන් පංගුවක් ලෙස ලියන්න.




..............................

18.පහත කොටුවේ ඇති සංඛ්‍යාවලින් සංඛ්‍යා හතරක් පමණක් යොදා ගනිමින් රටාවක් සාදන්න.

| | | |
|---|---|---|
| 3 | 10 | 11 |
| 7 | 14 | 15 |

............... ............... ................ ...............

19.A හා B භාජන දෙකේ ඇති ජල පරිමාව කොපමණද?




...........................................

20.එක් අයෙකුට ටොපි 4 බැගින් ටොපි 458 ක ටොපි මල්ලක් බෙදා දෙන ලදී. එහි ඉතිරි ටොපි ගණන කීය ද? ......................................

21.පාසලක පිරිමි ළමයි 1938ක්ද ගැහැණු ළමයි 34ක් ඊට වඩා වැඩියෙන් ද සිටිති. පාසලේ සිටින මුළු ළමයි ගණන කීය ද? ....................................

22.සීනි කිලෝ ග්‍රෑම් 4 ග්‍රෑම් 500ක ප්‍රමාණයකින් ග්‍රෑම් 250 පැකට් කීයක් සෑදිය හැකි ද?

............................................................

23.බදුල්ලෙන් පෙරවරු 6. 20ට කොළඹ බලා පිටත් වූ බස් රථයක් රත්නපුරයට ළඟා වන විට පැය 3 මිනිත්තු 45ක් ගත වී තිබුණි. රත්නපුරයට ළඟාවන විට වේලාව සම්මත ආකාරයට ලියන්න..................................................

24.මුහුණත් ගණන හා ශීර්ෂ ගණන එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවට වඩා දෙකක් අඩුවෙන් දාර තිබෙන ඝන වස්තුව නම් කරන්න. ..................................................

25.අම්මා රතු පාට රෙදි 4m 25cmක් ද සුදු පාට රෙදි 2m 8cmක්ද ගෙනාවාය. ඇය ගෙනෙන ලද මුළු රෙදි ප්‍රමාණය කොපමණද? ..................................................


26.පහත දැක්වෙන බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | ප්‍රමාණය | ඒකක මිල | මුදල |
|---|---|---|---|
| හාල් | 3 kg | 70.00 | ................. |
| සීනි | 1kg | ................ | 120.00 |
| කඩල | ................ | 120.00 | 240.00 |
| එකතුව | | | ................ |

27.ලීටර් දෙකක් අල්ලන බඳුනක ඇති ජලයෙන් තේ සෑදීම සඳහා 1*l* 200*ml* ගන්නා ලදී ඉතිරි ජල ප්‍රමාණය කොපමණද? ........................................................

28.නිමල්ගේ නිවසේ සිට පාසලට ඇති දුර කිලෝමීටර් 2යි මීටර් 550 වේ. තැපැල් කාර්යාලය පාසලේ සිට නිවස දෙසට වන්නට මීටර් 500ක් දුරින් පිහිටා තිබේ. නිමල් පාසලට ගොස් එන විට තැපැල් කාර්යාලයෙන් මුද්දරයක් මිල දී ගෙන පැමිණියේ නම් නිමල් ගමන් කළ මුළු දුර කොපමණ ද? ..........................................

29.ළමයින් 18ක් සිටින පන්තියක දින 5ක් තුළ 5 ශ්‍රේණියේ ළමයින්ගේ පැමිණීම පහත තීරු ප්‍රස්ථාරයෙන් දැක්වේ.




i. බ්‍රහස්පතින්දා පැමිණි ගණන 17කි. එය ප්‍රස්ථාරයේ ලකුණු කරන්න.

ii. දින පහේම පාසලට නොපැමිණි සිසුන් ගණන කීයද? ...................

( ලකුණු 30)

30. උරග ගණයට අයත් සත්ත්වයන්ගේ විශේෂ ලක්ෂණය වන්නේ

(1) පිහිනීමට හැකියාව තිබීම

(2) ගමන් කිරීමේ දී බඩ ගා ගෙන යාම

(3) ඕනෑම පෘෂ්ඨයක ගමන් කිරීමට හැකිවීම

31. බෝගවලට හෝ ජීවීන්ට හානියක් නොවන සේ කෘමීන් පලවා හැරිය හැකි ක්‍රමයකි.

(1) කෘමිනාශක දියර භාවිතය (2) කොහොඹ ඇට දියර දැමීම (3) කෘමි උගුල්

32. මනා සංවිධානයකින් යුතුව කටයුතු කිරීම නිසා සිදුවන යහපත් ප්‍රතිඵලයක් වන්නේ

(1) කටයුත්ත සාර්ථකව නිමකර ගත නොහැකි වීම

(2) කටයුත්ත නිම කිරීම සඳහා වැඩි කාලයක් ගතවීම

(3) කාලයෙන් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම

33. යහපත් දරුවකු තුළ දක්නට නොමැති ලක්ෂණයකි

(1) වැඩිහිටියන්ට උදව් කිරීම

(2) වැඩිහිටියන් සමග එකට එක කතා කිරීම

(3) සිනාමුසු මුහුණෙන් අන් අය ඉදිරියට යාම

34.පාපැදියක පිටුපස මඩ කවරයේ පහළ කොටසේ රතු පැහැති පරාවර්ථනයක් තිබීම මඟින් සිදු වන්නේ

(1) රාත්‍රියේ ගමන් කරන මගීන්ට පාපැදියක් එන බව දැන ගත හැකි වීමට

(2) රාත්‍රියේ ඉදිරිපසින් එන වාහනවලට පාපැදියක් එන බව දැන ගත හැකි වීමට

(3) රාත්‍රියේ පිටුපසින් එන වාහනවලට පාපැදියක් ඉදිරියෙන් යන බව දැන ගත හැකි වීමට

35. ජලයට තෙල් වර්ගයක් වැටුණු විට සිදුවන්නේ

(1) තෙල් ජලය මත පාවේ

(2) තෙල් ජලය යටට ගිලා බසියි

(3) තෙල් ජලය සමග මිශ්‍ර වේ

36 ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන ආයතනයක් පිහිටි නගරයක් වන්නේ

(1) අඹේවල (2) මහාඉලුක්පල්ලම (3) වැලිසර

37.ජලභීතිකා රෝගය වැළදීම පිළිබඳ ඉතාමත් නිවැරදී ප්‍රකාශය වන්නේ

(1) මහා මාර්ගයේ ගැවසෙන බල්ලෙකු සපා කෑම

(2) රෝග වාහක විෂබීජ ඇති බල්ලෙකු සපා කෑම

(3) සිව්පා සතෙකු සපා කෑම

38. තොටිල, කරල්හැබො, කදුරු යන ශාක ව්‍යාප්තිය සිදුවන ක්‍රම පිළිවෙලින් ඇති පිළිතුර වන්නේ

(1) සුළඟින් ,ජලයෙන්, සතුන් මඟින්

(2) සුළඟින් , සතුන් මඟින්, ජලයෙන්

(3) ජලයෙන්, සුළඟින් , සතුන් මඟින්

39. ඖෂධ සඳහා පත්‍ර , ගෙඩි, මුල් යන ශාක කොටස් ලබා ගත හැකි ශාක පිළිවෙලින් ඇති පිළිතුර වන්නේ

(1) නික, සැවැන්දරා, පාවට්ටා

(2) පාවට්ටා, නෙල්ලි, සැවැන්දරා

(3) කොහොඹ, පෙනෙල, වෙනිවැල්

40.පන්ති කාමරයේ සිටින ඔබට ළමයෙකු වීදුරුවක් අතින් රැගෙන දුවන අයුරු දක්නට ලැබේ. එය

(1) අනතුරු දායක ස්ථානයකි

(2) අනතුරු දායක අවස්ථාවකි

(3) සාමාන්‍ය ක්‍රියාවකි

41. ළමයෙක් ඉවත ලන තීන්ත බඳුනක් ගෙන එහි මිරිස් පැළයක් සිටුවා නිවසෙහි තබා ඇත. මෙම ක්‍රියාව වඩාත් ගැළපෙන්නේ

(1) ගම්බද නිවසකට (2) අලංකාර ගෙවත්තකට (3) මහල් නිවාසයකට

42. මිනිස් ක්‍රියාකාරකම් අතරින් සත්ව පැවැත්ම සඳහා හිතකර පියවර වන්නේ

(1) වනාන්තර ප්‍රදේශ එළිකර බෝග සිටුවීම

(2) වනාන්තර ප්‍රදේශ නම් කොට ඒවා ආරක්ෂා කිරීම

(3) පහත්බිම් ගොඩ කර නිවාස තැනීම

43. බඹර කැපීමේදී ගායනා කරන කවියක් වන්නේ

(1)ඉර දෙවියාන්ගේ ඉර ගල ගාවා

(2) දුම්බර කන්ද පාමුල මිනී රන් පතලේ

(3) බැද්ද වටට සුදු මොර මල් පිපීලා

44. විනිවිද පෙනෙන බඳුනකට ජලය දමා එයට නිල් තීන්ත මිශ්‍ර කර අයිස් කැට කිහිපයක් දමා ටික වේලාවකින් බැලූ විට වීදුරුව පිට පැත්තේ ජල බින්දු දක්නට ලැබුණි. එම පරීක්ෂණයේ දී නිල් තීන්ත මිශ්‍ර කරන්නේ,

(1) අලංකාරය වැඩි කර ගැනීමට

(2) ඇතුළත ඇති ජලය පිටතට පැමිණ තිබේ දැයි බැලීමට

(3) පැහැදිලිව බැලීමට හැකි වීම නිසා

45. බැරලයක් ලොරියකට පැටවීම සඳහා ලාභදායි හා පහසු ක්‍රමයක් වන්නේ.

(1) මිනිසුන් කිහිප දෙනෙකු එක් වී බැරලය ඔසවා තැබීම.

(2) පොළොවේ සිට ලොරියටම ලෑල්ලක් තබා බැරලය පෙරළීම

(3) දොඹකරයක් ගෙන ගෙනවිත් එය ලොරියට පැටවීම.

46.පන්තියේ සිටින ළමයෙකු නිතර ම ඉදිරියට පැමිණ කළු ලෑල්ලේ ලියා ඇති වචන කියවයි. මෙයට හේතු විය හැක

(1) ළමයා ඉදිරියට පැමිණීමට කැමැත්තක් දක්වන බවයි

(2) ඔහු ඇස් පෙනීමේ දුර්වලතාවයකින් පෙලෙන බවයි

(3) ගුරුවරයාගෙන් වැඩි අවධානයක් යොමු කර ගැනීමට බවයි

47. ප්‍රාදේශීය සභාව මගින් සිදුකරන මෙහෙයක් නොවන්නේ මින් කුමක් ද?

(1) ග්‍රාමීය මාර්ග නඩත්තු කිරීම

(2) නාගරික ප්‍රදේශවලට ජලය බෙදා හැරීම

(3) පාසල් උපකරණ හා පෙළ පොත්ලබාදීම

48. සාමූහිකව සිදුකරනු ලබන ක්‍රීඩාවක දී ජයග්‍රහණය ලබා ගැනීමට අත්‍යාවශ්‍ය යෙන් තිබිය යුතු කාරණයක් වන්නේ

(1) තමන් පමණක් බොහෝ මහන්සි වී ක්‍රීඩා කිරීම

(2) සෑම විටම හැමදෙනාටම උපදෙස් දීම

(3) සහයෝගයෙන් ක්‍රීඩා කිරීම

49. ආහාරයට ගන්නා ඇතැම් ද්‍රව්‍යවල ගුල්ලන් සිටීම දක්නට ලැබෙයි එසේ ගුල්ලන් දක්නට ලැබෙන්නේ

(1) කඩල හෝ කව්පිවල

(2) හාල්මැස්සන් හෝ කරවලවල

(3) ඉදුණු පලතුරුවල

50. අක්කා දම්වැල් මැස්ම යොදා ගනිමින් ඇඳුමක යමක් මසෙමින් සිටිනු දක්නට ලැබුණි අක්කා මසමින් සිටියේ

(1) ඇඳුමේ වාටියක් (2) ඇඳුමේ මලක් (3) ඇඳුමේ ඉරුණු තැනක්

51. බත් පිසීමේ දී සහල් ගැරීමට වඩාත් උචිත භාජනය වන්නේ

(1)කොරහා (2) මැටි කෝප්පය (3) නැඹිලිය

52. සිතියමක ගංගා දැක්වීම සඳහා යොදා ගන්නා වර්ණය වන්නේ

(1)රතු පාට (2) කළු පාට (3) නිල් පාට

53. වගා කටයුතු වලදී අස්වැන්න නාස්ති වන අවස්ථාවක් නොවන්නේ

(1) විවිධ රෝග වැළඳීමෙන් (2) ප්‍රවාහන කරන අවස්ථාවන්හිදී (3) පොහොර යෙදීමෙන්

54. ශාකවල වර්ධනයට අහිතකර ලෙස බලපෑමක් ඇති කරන සත්ව හැසිරීමක් වන්නේ

(1) ශාකවල පරාග පෝෂණය කිරීම
(2) ශාක මත විවිධ අන්දමින් වාසස්ථාන සකස්කර ගැනීම
(3) සත්ව මළමූත්‍ර පරිසරයට මුදා හැරීම

55. අභය වැව හෙවත් බසවක්කුලම වැව කරවන ලද රජතුමා වන්නේ

(1) දේවානම්පියතිස්ස රජතුමා (2) ධාතුසේන රජතුමා (3) පණ්ඩුකාභය රජතුමා

56. පුද්ගලයෙකුගේ ශරීර ස්කන්ධ දර්ශකය (BMI අගය) සකස් කරනු ලබන්නේ

(1) ශරීරයේ උස හා වයස අතරඅනුපාතයට
(2) ශරීරයේ බර හා වයස අතර අනුපාතයට
(3) ශරීරයේ උස හා බර අතර අනුපාතයට

57. ලියුම් කවරයක මුද්දර අලවනු ලබන්නේ

(1) ඉහළ කෙළවරේ දකුණු පසට වන්නට
(2) ඉහළ කෙළවරේ වම් පසට වන්නට
(3) ලිපිනයට පහළින් ය

58. අපිරිසිදු ජලය පානය කිරීම නිසා වැළඳෙන රෝගයකි.

(1) සෙංගමාලය (2) කම්බුල්ගාය (3) සෙම්ප්‍රතිශ්‍යාව

59. හොඳින් මේරූ බීජයක් හඳුනා ගත හැකි ලක්ෂණයක් වන්නේ.

(1) ජල භාජනයකට දැමූ පසු බීජය පතුලට බැසීම
(2) බීජයේ තැනින් තැනකඩතොලු වීම හෝ පුල්ලි සහිත වීම
(3) බීජය ජලය මත පාවීම

( ලකුණු 30 )

60.ඔබ උදෑසන අවදි වී මිදුලට යන විට මල්ලී දුව ගෙනවිත් "අයියා ටොමියා ගෙදර නෑ" යැයි පැවසුවේ ය. ඔබ නිවස අසල හා බැලූ නමුත් ඌ දක්නට නොලැබුණි. මින් ඉදිරියට ඔබත් මල්ලීත් ටොමියා සොයා ගන්නා ආකාරය වැකි තුනකින් ලියන්න.

(1) ..............................................................................................................

..............................................................................................................

(2) ..............................................................................................................

..............................................................................................................

(3) ..............................................................................................................

..............................................................................................................

( ලකුණු 6 )

PAST PAPERS WIKI